# මාලුත ජාතකය

තවද එක්සමයෙක්හි සව්නේගෙවාදත් බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් වැඩ කළ මහණ වූ භික්ෂූන් දෙනමක් අරභයා මේ ජාතකය වදාළ සේක. ඒ භික්ෂු දෙනම කොසොල් ජනපදයෙහි එක් ආරණ්‍ය විහාරයෙක්හි වසන සේක. එක්කෙනෙක් කාලස්ථිවිර නම, එක්කෙනෙක් පුණ්හස්ථවිර නම, ඉක්බිත්තෙන් එක්දවසක් ජුණ්හස්ථවිරයන් වහන්සේ කාලස්ථවිර නම, ඉක්බිත්තෙන් එක්දවසක් ජුණ්හස්ථවිරයන් වහන්සේ කාලස්ථවිරයන් වහන්සේ ගෙන් විචාරණසේක් ස්වාමීනි. කාලස්ථවිරයන් වහන්ස ශිතනම් කවර කලෙක්හි වන්නේදැයි විචාල සේක. හෙතෙම කාල පක්ෂයෙහි වන්නේ යයි කී සේක. ඉක්බිත්තෙන් එක් දවසක් කාලස්ථවිරයන් වහන්සේ ජුණහස්ථවිරයන් වහන්සේ අතින් විචාරණසේක් ස්වාමීනි ජුණ්හස්ථවිරයන් වහන්ස ශිතනම් කවරකාලෙක්හි වන්නේදැයි විචාළ සේක. හෙතෙම පුණ්හපක්ෂයෙහි වන්නේ යයි කී සේක. ඔහු දෙදෙනාම තම තමාගේ ශංකා සිඳින්නට නොහැකිව සර්වඥයන් වහන්සේ සමීපයට ගොස් සර්වඥයන් වහන්සේට නමස්කාර කොට ස්වාමීනි සර්වඥයන් වහන්ස ශිතනම් කවරකලෙක්හි වන්නේදැයි විචාළාහුය. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන්ගේ කථාව අසා වදාරා මහණෙනි මම පූර්වයෙහිත් තොපට මේ ප්‍රශ්නය දේශනාකෙළමි, භවයෙන් වැසී තුබුනු බැවින් නොසැලකුවාහු දැයි වදාරා ඉකුත්වත් දක්වා වදාල සේක.

යටගිය දවස එක් පර්වත ප්‍රාන්තයෙක්හි සිංහයෙක්ද ව්‍යාඝ්‍රයෙක් දැයි කියා යහළුවෝ දෙදෙනෙක් එකම ගුහාවෙක්හි වසන්නාහුය. එකල්හී බෝධිසත්වයන් වහන්සේද ඍෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව ඒ පර්වත ප්‍රාන්තයෙි වාසය කරණසේක. ඉක්බිත්තෙන් එක් දවසක් ඒ යහළුවන් දෙදෙනාට ශිතය නිසා විවාදයක් උපන, ව්‍යාඝ්‍රයා කාළපක්ෂයෙහි වන්නේයයි කීයේය. සිංහයා ජුණහපක්ෂයෙහි ශිතවන්නේයයි කීයේය. ඔහු දෙදෙනාම තමාගේ ශංකා සිඳින්ට නොහැකිව බෝධිසත්වයන් වහන්සේ අතින් විචාළාහුය. බෝධිසත්වයන් වහන්සේ වදාරණ සේක් කෘෂ්ණ පක්ෂයෙහිද නොහොත් ශුකුල පක්ෂයෙහිද යන මේ දෙපක්ෂයෙන් යම් කලෙක්හි පූර්වාදී දිගින් යුක්තව මාරුතය හමාද එසමයෙහි ශිතවෙයි. ඊට කාරණ කවරේද.ශිතය වාතයෙන් හටගන්නේය. වායු හමන කල්හි ශිතය වන්නේය. කෘෂ්ණපක්ෂය ශුකල්පක්ෂයම ප්‍රමාන නොවන්නේය. තොපි දෙදෙන මේ ප්‍රශ්නයෙහි නොපැරදුනාහ. මෙසේ බෝධිසත්වයන් වහන්සේද මහණෙනි පෙරත් මා විසින් තොපට මේ ප්‍රශ්නය කියන ලද්දේයයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා දුක්ඛ සමුදය නිරෝධ මාර්ග යන චතුරාර්ය සත්‍යයන් ප්‍රකාශ කොට වදාළ සේක. චතුස්සත්‍යයාගේ කෙළවර ඒ ස්ථවිරයන් දෙදෙනා වහන්සේම සෝවාන් ඵලයෙහි පිහිටියාහුය. ශාස්තෘන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළ සේක. සිංහතෙම ජුණහස්ථවිරවූයේය. ප්‍රශ්නය විසර්ජනය කළාවූ තපස්විම උපන්නෙමි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාල සේක.